# උතුවන් කන්ද

අප සංචාරයේ අරමුණ: උතුවන් කන්ද තරණය, සූර සරදියෙල් හා සම්බන්ධ ස්ථාන, විශේෂයෙන් ගල් ගුහා අධ්‍යානය කිරීම, ජායාරූප ලබා ගැනීම
දිනය :2014 මාර්තු 15 වන දින
සහභාගී වුවන් ගණන: 4 (නිශාන් කුළසිංහ, මධුජිත් රාජකරුණා, ලසිත රත්නායක, මුදිත රූබසිංහ)
ගමන් කල ආකාරය: කොළඹ - මහනුවර බසයෙන්
ජයාරූප අනුග්‍රහය: නිශාන් කුළසිංහ, ලසිත රත්නායක,
මෙම වාර්තාව සැකසූයේ: නිශාන් කුළසිංහ විසිනි.

**කොළඹ සිට ගමන් මාර්ගය**
කොළඹ - මහනුවර A1 මාර්ගය>උතුවන් හන්දිය බස් නැවතුම (කෑගල්ල පසු කර, මාවනැල්ලට පෙර)> උතුවන් මාවත > උතුවන් කන්ද



www.lakViskam.org

**පරිසරය පිළිබඳව**
මෙම ප්‍රදේශය කෘෂි භෝග වගා ආර්ථිකයක් පවතින ගම්බද ප්‍රදේශයකි. වී ගොවිතැන, සහ රබර් කිරි ලබා ගැනීම ඉන් ප්‍රධාන වේ. උතුවන් කන්දේ සරදියෙල් නම් වීර චරිතය ජීවත් වුයේ මේ ප්‍රදේශය ආශ්‍රිතවය.ඔහු ඉංග්‍රීසීන්ගෙන් ගැලවීමට හා සැඟවී සිටීමටත් මං පැහැරීමට ඔත්තු බැලීමටත් මෙම කන්ද ආශ්‍රිත ප්‍රදේශ යොදා ගත්බව කියවේ. කුඩා වනාන්තරයක් සහිත විශාල ගල්වලින් සමන්විත ගල්ගුහා පද්ධතියක් සහිත පර්වත ප්‍රදේශයකි.කොළඹ නුවර මාර්ගයේ ගමන් කරද්දී කෑගල්ල පසු කර ටික දුරක් යද්දී වම්පසට වන්නට ඉදිරියෙන් පෙට්ටි හැඩති ගල් කිහිපයක් සහ මුදුනේ කම්බි කූරු සහිත කන්දක් ලෙස මෙය පැහැදිලිව ඔබට දැක ගත හැක. කන්ද මුදුනට අලගල්ල, බතලේගල ආදී කදු පර්වත දර්ශනය වේ. සමහර අවස්ථාවල මීදුමෙන් වැසී යයි.ජල පහරවල් හා කූඩැල්ලන් දක්නට නොමැත. කළුගල් හා මාර්ගයේ ඇතැම් ස්ථාන ලිස්සන සුළුය. ගල් පෙරලී යා හැක. ඒවායින් තුවාල සිදු විය හැක. පිඹුරා වැනි අනතුරුදායක සතුන් මෙම කන්ද අවට ගම්මාන වලින් වාර්තා වී ඇත.කදු මුදුනේ විශාල වශයෙන් බඹර කූඩු ඇත. මේ සියලු පරිසර තත්වවලට පෙර සූදානමක් ඇතිව ඇදුම් බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

**කාරුණික ඉල්ලීමයි.**
කරුණාකර ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය ප්‍රදේශයට ගෙනයාම සීමා කරන්න. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. මත්පැන් පානය කර මෙම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් අන් අයගේත් යහපත පිණිසම හේතු වනු ඇත.මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂා කර තබන්න. මෙය 'ලක් විස්කම්' ඔබෙන් කෙරෙන කාරුණික ඉල්ලීමයි!

**උතුවන් කන්ද ආශ්‍රිත මෑත ඉතිහාසය.**
සබරගමුව උතුවන නම් ගමේ පිහිටි උතුවන්කන්ද මෑත ඉතිහාසයේදී වඩාත් ජනප්‍රියවී ඇත්තේ සූර සරදියෙල් නමැති වීර චරිතය නිසාය. ඔහු එකල ශ්‍රී ලංකාව යටත්කරගෙන සිටි ඉංග්‍රීසි ආණ්ඩුවට තනිව අභියෝග කල අයෙක් ලෙස සඳහන් ඉතිහාසයට එක් වේ. සිංහල ජාතිකයකු හා බෞද්ධාගමිකයකු වූ දීකිරිකෑවගේ සරදියෙල් උපත ලබා ඇත්තේ 1832 මාර්තු මස 25 වන දින කෑගල්ලේදීය. හාල්දඩුවන ගමේ වාසයකල කරත්තවලින් ගොස් දුම්කොළ වෙළදාමේ යෙදුනු අදාසි අප්පු ඔහුගේ පියා වේ. ඔහු කතෝලිකයකු විය. උතුවන් කන්ද, මොළගොඩ විසූ පිචෝ හාමි ඔහුගේ මව විය. පවුලේ වැඩිමහල් දරුවා වූ සරදියෙල්ට තවත් සහෝදර සහෝදරියන් සතරදෙනෙකු විය. අදාසි අප්පු විසින් මෙම බාල දරුවන් සතරදෙනා හලාවත පල්ලියකදී බව්තීස්ම කරවන ලදී. අදාසි අප්පුගේ දරුවන්ගේ නම් මෙසේ වේ. සරදියෙල්, ගබ්රියෙල්, පේදුරු, අන්තෝනි හා ගැහැණු දරුවා මාර්තා. ඇය කුඩා කලදීම මියගොස් ඇත. සරදියෙල් පමණක් ඉලුක්ගොඩ විහාරස්ථානයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ අතර පාසලේ බුද්ධිමත් දරුවකු වූ බවද පැවසේ. වරක් ඔහු පොහොසත් ගම්මුලාදෑනියකුගේ පුතකුගේ වටිනා හවඩියක් සොරකම්කලා යන සාවද්‍ය චෝදනාවක් මත පොලිසියෙන් අච්චු ලබා ඇත. ඒ සමග ඔහුගේ පාසල් ගමනද නවතී.ක්‍රමයෙන් සොරකමට නැඹුරු වූ ඔහු එසේ සොරකම් කරන ලදදේ දුපත් ජනතාව අතරද බෙදා දී ඇත. මේ හේතුව නිසා ඔහු ශ්‍රී ලංකාවේ "රොබින් හුඩ්" යන අන්වර්ථ නාමයෙන් හදුන්වයි. සරදියෙල් කොළඹට පැමිණ ඉංග්‍රීසීන්ගේ රයිපල් බැරැක්කයක සේවය කර එම ආයුධ පිළිබදව මනා දැනුමක් ලබා ගත්තේය. ඉංග්‍රීසීන් කෙරෙහි කලකිරුණු ඔහු අවසානයේ රයිපල ඇතුළු ආයුද කිහිපයක් රැගෙන පලා යයි. මෙම ආයුධ භාවිතා කර මංකොල්ල කෑම කරගෙන ගිය ඔහු මොල්ලිගොඩ වලව්ව කොල්ල කෑම නිසා අත්අඩංගුවට ගැනීමට නියෝග නිකුත් විය. මෙම අවස්ථාවේදී සිය පියාගේ රැකවරණයද නොලැබුණු නිසා උතුවන්කන්දට ගොස් එහි සැඟවී සිටියේය. පොලිසිය ඔහු අල්ලන්ට එන විට කන්දේ වූ ගල්ගුහා තුලද සමහර අවස්ථා වලදී වැගන්තලාව නම් ගම හරහා දුව ගොස් මහා ඔයේ බෝ ඇල්ල නම් දිය ඇල්ලේ ගල් වක්කඩෙන් එගොඩට පැන සැඟවී ගත්තේය.

www.LakViskam.org



අත් අඩංගුවේ සිටිනඋතුවන් කන්දේ  සරදියෙල්



අත් අඩංගුවේ සිටින මම්මලේ මරික්කාර්

www.LakViskam.org

සරදියෙල් උතුවන්කන්දට ගොස් ක්‍රමයෙන් 300 ක පමණ සොර කල්ලියක් සාදා ගත්තේය. කුරුණෑගල, පොල්ගහවෙල, රඹුක්කන, බදුල්ල ආදී ප්‍රදේශ වල ඔවුන් කොල්ලකෑමේ යෙදුනු අතර මෙම ක්‍රියාකාරකම් නිසා ඔහුගේ නාමය  මුළු දිවයිනේම ප්‍රචලිත විය. ඔහු ඇතුළු කණ්ඩායම අතින් කිහිප දෙනෙකුම මැරුම් කෑවේය. ඔහුගේ නම ඇසූ පමණින් බොහෝදෙනා භීතියෙන් ඇලලී යන්නට විය. කෙසේ වෙතත් ඔහු කොල්ල කෑ බොහෝ දේ දිළින්දන් අතර බෙදා දුන්නේය. සිය හොඳම මිතුරා වූ මම්මලේ මරික්කාර්ගේ විවාහක සහෝදරියක වූ තන්ගම්මා නොහොත් මේනකා සමග අනියම් ප්‍රේම සබඳතාවයක්ද සරදියෙල්ට තිබුණි. සරදියෙල් පිලිබඳව ඔත්තුවක් ලබා දෙන අයෙකුට පවුම් 200 ක් ලබා දෙන බවට බ්‍රිතාන්‍යයන් විසින් ගැසට් මගින් නිවේදනය කරන ලදී. සරදියෙල් අල්ලා ගැනීමට නොහැකි නිසා පැවති අභියෝගය හමුවේ කෑගල්ල උපදිසාපති තැන තුන්දවසකට කෑමද සහිතව විශේෂ පොලිස් කණ්ඩායමක් සමග සරදියෙල් සිටි ප්‍රදේශය වැටලීය. සරදියෙල් සමග සිටි හොඳම මිතුරකු වූ සිරිමලා නමැත්තා සරදියෙල් මාවනැල්ල ගඩොල් පාලම අසල නිවසක සැඟවී සිටින බව පොලීසියට දැන්වීය. පොලිසිය ස්ථානය වැටලූ අතර එහිදී මම්මලේ මරික්කාර් විසින් තැබූ වෙඩි පහරකින් කොස්තාපල් සබ්භාන් මරුමුවට පත් විය. සරදියෙල්ගේ පාදයකට ද වෙඩි වැදින. සබ්භාන් ලංකා පොලිස් ඉතිහාසයේ නීතිය සුරැකීමේදී මිය ගිය පළමු පොලිස් සාමාජිකයා ලෙස සලකන අතර ඔහු මියගිය 1864 මාර්තු 21 දිනය අද පොලිස් දිනය ලෙස සමරයි. අවසාන සටනේදී තුවාල ලැබූ සරදියෙල් සිය ප්‍රධාන හවුල් කරුවා වූ මම්මලේ මරික්කාර්  සමග 1864 මාර්තු 21 දින පොලිසියට යටත් විය. එම වසරේම අප්‍රේල් මස 04 දින නඩු විභාගයෙන් වරදකරුවන් වූ ඔවුන් දෙදෙනා බෝගම්බරදී එල්ලා මැරීමට නියම කරන ලදී. එම තීන්දුව අනුව 1864 මැයි 04එල්ලා මැරීමට සූදානම් වුවත් එදින එය වලක්වා එම මස 07 දින බෝගම්බරදී වෙඩි තබා මරා දමන ලදී.සරදියෙල් මිය යාමට ප්‍රථමයෙන් පූජකතුමකුගේ මෙහෙයවීමෙන් කතෝලික ආගම වැළඳගෙන ජෝශප් යන නම භාවිත කරන ලදී.

**ගමන ආරම්භ කරමු.**

අප උදෑසනම පිටකොටුව ලංගම බස් නැවතුම්පලේ මහනුවර බසයකින් ගොස් උතුවන් හන්දියෙන් බැස ගතිමු. උතුවන් කන්දට යන මාර්ගය දක්වන දැන්වීම් පුවරුඑහි සවි කර තිබූ අතර එතැන්සිට කි.මී. 1.5ක් පමණ දුරක් උතුවන් මාවත ඔස්සේ දර්ශනීය ගම්මානය මැදින් කන්ද නැගීම ආරම්භ කරන ස්ථානයට ගමන් කල යුතුය. අප පෙ.ව. 9.40ට පයින් ගමන ආරම්භ කල අතර විනාඩි 15 කින් කන්ද නැගීම ආරම්භ කරන ස්ථානයට පැමිණ තැඹිලි ගෙඩියකින් පිපාසය නිවා ගත්තෙමු. අතීත උතුවන් ගම සහ සමාජය නිරූපණය වන සේ නිර්මාණය කල සරදියෙල් ගම නම් ස්ථානයක් මෙහි ඇති අතර එය නරඹන්නේනම් මුදල් ගෙවා ප්‍රවේශපතක් මිලදී ගත යුතුය. සරදියෙල් ගම අභ්‍යන්තරයේ අවන්හලක්ද පවත්වාගෙන යයි.


උතුවන් කන්ද


සරදියෙල් ගම

www.LakViskam.org

ඉතා දර්ශනීය වෙල් යායක් ඔබ්බෙන් වූ රබර් සහ කැලයක් මතින් නැගී  සිටින ප්‍රතාපවත් උතුවන් කන්ද පර්වතය මෙම ස්ථානයට හොඳින් දර්ශනය වේ. මෙම පර්වතය උසින් අඩි 1410 ක් වේ. මෙහි ඉහලින් දක්නට ඇති පෙට්ටි හැඩති පර්වත කොටස සරදියෙල් ගල නම් වේ. සුර සරදියෙල් විසින් අවට සිසාරා ඔත්තු බැලුවේ මෙම සරදියෙල් ගල මුදුනේ සිටය. මෙහි හැඩය නිසා ඉංග්‍රීසීන් විසින් මෙම පර්වතය "කාසල් රොක්" නමින් හැඳින්වූ බවට කිය වේ (සිගිරිය පර්වතයද කාසල් රොක් නමින් එකල හඳුන්වා ඇත). එයට හේතුවූයේ කන්දේ මුදුන යුරෝපයේ රයින් මාලිගාවේ දුම් චිමිනියේ හැඩයට සමාන වීම නිසා බවද පැවසේ.


කන්ද මුදුන ගම්මානයට පෙනෙන අයුරු


රබර් වත්තේ විශාල කළු ගල් අතරින් ඉහලට දිවෙන මාර්ගය

පටු කොන්ක්‍රීට් පාර ඔස්සේ ඉදිරියට ගමන් කරනවිට මැතකදී ඉදිකළ එළිමහන් ශාලාවක් වැනි ගොඩනැගිල්ලක් හමු වේ. එයට උඩින් ඇති පාරේ ගමන් කලාහොත් සාමන්‍ය මාර්ගය ඔස්සේ කන්දට පිවිසිය හැක. එම ගොඩනැගිල්ලට පහලින් ඇති ඉඩම ඔස්සේද ගොස් කන්ද තරණය කිරීමට දුෂ්කර කැලෑ මාර්ගයක් ඇති බව ගම්මුන් පවසන ලදී. මේ කැලෑ පාරේ ගිය අපට හමු වුයේ කළුගල් කඩන ලද විශාල ගල් තලාවකි. ඒ ඔස්සේ අඩි පාරක් සොයා ගැනීමට අපහසු වූ නිසා පෙරකී සාමන්‍ය මාර්ගයට අතර මගින් හැරී නැවත සම්බන්ධ වූයෙමු. එම මාර්ගය ඔස්සේ යද්දී නිවාස කිහිපයක් පසුකර රබර් වගාවක් සහිත ඉඩමකට පිවිසිය හැකිවේ. එහිදී අඩි පාර දෙකට බෙදෙන ස්ථානයක් හමු වන අතර කෙලින් මාර්ගයේ නොගොස්  ඔබ යා යුත්තේ නැග්මක් සහිත වමට විහිදෙන අඩි පාරේය. සුළු මොහොතකින් අපට විශාල ගලක් අතරින් ඉදිරියට යායුතු ස්ථානයක් හමු විය. එය පසු කර ගිය විට ගස් අතරින් අංශක 90ට ඉහලට නැගී සිටින මහා කළු ගල් පර්වතය දක්නට ලැබෙනු ඇත. මෙම ස්ථානයේදී කන්දට යාමට නම් වම් පසින් ඇති අඩි පාරේ ඉහලට නැගිය යුතුය. නමුත් ඔබ දකුණු පසින් ඇති ගල්වලට නැග ගල් අතරින් රිංගා ඉදිරියට ගියවිට සියඹලා ගසක් අසලින් ඇති ගල් ගුහාවක් හමු වේ. මෙම ගුහාවට පැහැදිලි අඩි පාරක් අඩිපාරක් නොමැත. සරදියෙල් පොලීසිය තමාව අල්ලන්නට එනවිට වහා කන්දෙන් බැස මෙම ගල්ගුහාවේ සැඟ වුනු බවට කියවේ.



ගල්ගුහාවට යායුතු ස්ථානය



ගල්ගුහාවේ ඇතුලත

දැඩි අන්ධකාරයකින් හා පටු බවකින් යුතු මෙහි අභ්‍යන්තරයට ගමන් කරන්නේ නම් විදුලි පන්දමක් අත්‍යාවශ්‍ය වේ. එසේම පටු තැන් වලින් රිංගා අපහසුවෙන් ඉදිරියට යා යුතු වේ. එසේ ගමන් කිරීමේදී ඉතා පටු ස්ථානවල ශරීරය සිර විය හැකි බැවින්ද ගල්වල හිස වැදීමට ඉඩ ඇති බැවින්ද හා අන්තරායකාර සර්පයින් සිටිය හැකි බැවින්ද ඒ පිළිබඳව ඉතා කල්පනාකාරී විය යුතුය. එසේ අපහසුවෙන් ඇතුලට ගිය අපට මෙම ගුහාව අතු වශයෙන් බෙදී විවිධ දිශා වලට ගමන් කරන බවට නිරීක්ෂණය කල හැකි විය. එම ගුහා අඩි 40-50ක් පමණ විහිදී ගොස් අවහිර වී ඇත. ඇතුලත සීතල බවකින් යුක්ත වුවත් ඇතුලට ගමන් කිරීමට දැරිය යුතු ආයාසය නිසා අපව දහදියෙන් නැවී ගොස් තිබුණි. සරදියෙල් ක්ෂණයකින් මෙම ගුහාව තුල සැගවී ගත් බවට ගම්මුන් විසින් අපට පවසන ලදී. ගල්ගුහාවේ බොහෝ වේලාවක් ගත කල අප ඉන් එළියට පැමිණ නැවත කන්ද නැගීමට පටන් ගත්තෙමු. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය වනාන්තරයක ලක්ෂණ දක්නට වූ අතර ගස් අලංකාර මල් වලින් සැරසී තිබුණි. ගස් ගල් උඩින් වැල්වල එල්ලී තරමක අපහසු ගමනකින් පසු සරදියෙල් ගල ඉතා පැහැදිලිව දක්නට ලැබෙන තැනකට විනාඩි 15කින් පමණ ළගාවීමට හැකි විය.



ගස් මලින් බර වී



සරදියෙල් ගලආසන්නයට පැමිණ

ගල්තලාව ඔස්සේ ඉදිරියට ගිය විට පහලින් පිහිටි කුඩා ගුහාවක් වැනි ස්ථානයක් දක්නට ඇත. අප එන ශබ්ධය ඇසී පෙම් කෙළිමින් සිටි ලාබාල තරුණ යුවලවල් කිහිපයක් කලබල වී පිටතට පැමිණියහ. ගුහාව ඇති ස්ථානයේදී අප රැගෙන ආ ආහාර අනුභව කර සරදියෙල් ගල තරණයට සූදානම් වූයෙමු.



කලබල වී මග හැර යන පෙම්වතුන්



කන්ද මුදුනේ ගුහාව

දැඩි හිරු රශ්මියෙන් ගල්තලාව ගිනියම්ව තිබිණි. සරදියෙල් ගල ඇති ස්ථානයට යාමට නම් අංශක 87-89 ක් පමණ බෑවුම් වන ගල්තලාව කඹයක් ආධාරයෙන් නැගිය යුතුය. එසේත් නැත්නම් දකුණු පසට ගමන් කර විශාල හෙලකට මායිම්වන ස්ථානයකින් ගලට නැගිය යුතුය. මේ දෙකම ඉතාමත් අවදානම් සහිත වන්නේ වැරදුනහොත් මහා ප්‍රපාතයකට ඇද වැටී ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවනු ඇති බැවිනි.



කඹය සකසමින්



කඹය ආධාරයෙන් මුදුනට

සරදියෙල් ගල ආරම්භවන ස්ථානයට අමාරුවෙන් නැග ගත් අප  අවට පරීක්ෂා කරද්දී දුටුවේ ගලේ වම්පස පහල ගල් පර්වතයක් මත එල්ලෙන සේ බැඳ තිබූ විශාල බඹර වද සමූහයි. ශබ්ධ නොනගා කටයුතු කිරීමට අප වග බලා ගත්තේ උන් ඇවිස්සුනහොත් අපට සිදු වන මහා විනාශය හොඳින් දන්නා නිසාය. සරදියෙල් ගලේ උස්ම කොටසට පිවිසීමට උල් හැඩඇති ගල් කුලක් මතට නැගිය යුතු අතර එය කන්දේ උස්ම ස්ථානය වේ. අංශක 90 ට පිහිටා ඇති එයට ගොඩවීම ඉතා අවදානම් හා අපහසු කටයුත්තක් වේ. මෙම ගල මුදුන වානේ කම්බි කිහිපයක් ගිල්ලවා සකස් කර ඇත. ගල මුදුනට බලපාන සැඩ සුළං ප්‍රවාහයෙන් බේරී ගල මත රැඳී සිටීමට මෙම කම්බි සවිකර ඇති අතර ඒවා සවිකරන ලද්දේ අතීත මිනුම් කටයුතු වලදී ප්‍රයෝජනයට ගැනීමට බව පැවසේ.



බඹර කූඩු සමූහය



ගල මුදුනේ ගිල්වා ඇති කම්බි

www.Lakviskam.org

ගල මුදුනේ සිට බලන විට උරා කන්ද, දෙවනගල කඳු, බතලේගල, අලගල්ල, යන කඳු මෙන්ම කෑගල්ල, මාවනැල්ල, සහ අවට සිසාරා සතර අතම හොඳින් දර්ශනය වේ. ගල මත බඹරුන් එකා දෙන්නා සැරි සැරීම අපට මහත් බියක් ගෙන දෙන්නට විය. එම නිසා සරදියෙල් ගලෙන් බැස එම ගලේ ඉදිරිපස ගල් තලාවට ගමන් කළෙමු.



ගල මුදුනේ සිට



යටි පතුල් හැඩති ගල්

www.LakViskam.org

එහිදී සරදියෙල් ගල දිස් වුයේ අමුතුම හැඩයකිනි. එනම් යම් සත්වයකුගේ යටිපතුල් ගලෙන් කිරීමට ගත් උත්සහායක් ලෙසයි. මෙම හැඩතල ස්වභාවිකව සෑදුනා විය හැක. කෙසේ නමුත් මෙම කන්දේ විශේෂ ලක්ෂණ සලකා බලනවිට මෑත ඉතිහාසයේ සරදියෙල්ගේ කතාවට වඩා ඈතට දිවෙන ඉතිහාස කතාවක් තිබිය යුතුය යන්න මාගේ පුද්ගලික අදහසයි. අවට අසිරිය රිසිසේ විඳගත් අප සතර දෙනා පස්වරු 2 වන විට ප්‍රවේශමෙන් කන්දෙන් බැස්සෙමු. උතුවන් හන්දියට පයින් පැමිණ හෝටලයකින් දිවා ආහාරයද ගෙන රෑ බෝ වීමට ප්‍රථම කොළඹ බලා ආවෙමු.

අප සංචාරයේ තවත් ජායාරූප එකතුවක් පහත යොමුවෙන් නරඹන්න.

https://picasaweb.google.com/102500057347588371605/UthuwanKanda2014?noredirect=1

මෙම වාර්තාවේ අයිතිය “ලක් විස්කම්” වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org(12-ඔක්තෝම්බර්-2014)

විමසීම්සහ අදහස්: lakviskam@gmail.com

-දී කිරි කෑවගේ සරදියෙල් හා මම්මලේ මරික්කාර් ගේ ජයාරූප අන්තර්ජාලයෙන් ලබා ගන්නා ලදී.-